**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය - 2018**
**---------------------------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, යෝජනා ක්‍රමයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනාක්‍රමයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිත 16 පරිදි සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු.31,732,585 ක්වූ මෝටර් රථ 24 ක් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද එම රථයන්හි ඵලදායි ජීවිත කාලය සලකා බලා ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ගිණුම් ගත කිරීමේදී මණ්ඩලයේ ප්‍රතිපත්තිය වන්නේ පිරිවැය අගය මත වත්කම් ගිණුම්ගත කිරීමයි. මේ වන විට සියළුම වාහන සඳහා වර්තමාන වෙළඳපල අගය, මත පදනම්ව තක්සේරු වාර්තාවක් ලබාගෙන ඇති අතර, ඉදිරි වර්ෂයේදී අදාල ගැලපීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ. | එම රථයන්හි ඵලදායි ජීවිත කාලය සලකා බලා ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) ප්‍රමිත 37 හි 59 වන ඡේදය ප්‍රකාරව සක්‍රිය දායකයන් හඳුනා ගැනීමට ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද එසේ කිරීමෙන් තොරව 2018 දෙසැම්බර් 31 දිනට ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල සඳහා රු.19,853,880 ක ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගොවීන්ගේ මරණ හා බෙලහීන පාරිතෝෂික ගෙවීම සඳහා වෙන් කිරීම ගොවි විශ්‍රාම වැටුප් අරමුදල මගින් ගණනය කොට ගොවීන්ගේ මරණ හා බෙලහීන පාරිතෝෂික අරමුදලට බැර කරනු ලබයි. | 2007 වර්ෂය පරිදි ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහියංගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන්හි පවත්වාගෙන යන නිල නිවාසයන්හි යෝජනා ක්‍රමයට අයත් පර්චස් 76.6 ක ඉඩම් වටිනාකම සහ ඇඹිලිපිටිය නිල නිවසේ ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මහියංගනය, ඇඹිලිපිටිය හා අනුරාධපුරය යන නිල නිවාසයන්හි ඉඩම් වල වටිනාකම හා ඇඹිලිපිටිය නිල නිවාසයේ වටිනාකම තක්සේරු කර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර, කඩිනමින් එම කටයුතු අවසාන කර තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2013 හා 2014 වර්ෂයන්හිදී මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් හා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් පවරන ලද මෝටර් රථවල වටිනාකම තක්සේරු කර ගිණුම් වලට ගෙන නොතිබුණි. | මෙම රථ ඉදිරි වර්ෂයේදී දේපල පිරියත උපකරණ යටතේ ගිණුම්තුල ඇතුලත් කිරීමට කටයුතු කරනු ලබන අතර, මේ වන විට තක්සේරු වාර්තා ලබාගෙන ඇත. | වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | වසර 5 – 25 අතර කාලයක සිට පැවත එන එකතුව රු.857,406 ක් වූ සේවක ණය සහ අත්තිකාරම් සේවක පාරිතෝෂිතයෙන් හෝ ඇප කරුවන්ගෙන් කාලීනව අයකර ගැනීමකින් තොරව ගිණුම් වල ඉදිරියට එමින් පවතී. | මණ්ඩලයේ සේවයෙන් ඉවත් වී ගිය/ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ, ගෙවීම් පැහැර හැර ඇති ණය ශේෂයන් හා පොළී මුදල් අයකර ගැනීම සඳහා එන්තරවාසි යවා ඇති අතර, ඒ අනුව ගෙවීම් නොකලහොත් ඉදිරියේදී ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | පාරිතෝෂිතයෙන් හෝ ඇප කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | වසර 5-14 අතර කාලයක සිට ඉදිරියට එමින් පැවතුණු එකතුව රු.708,337 ක ලැබිය යුතු වැටුප් , වැටුප් අත්තිකාරම් හා මිශ්‍ර ණයගැති ශේෂයන් නිරවුල් කර ගැනීමකින් තොරව ගිණුම් වල ඉදිරියට එමින් පවතී. | මණ්ඩලයට විවිධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු රු. 708,347/- ක මෙම ශේෂය අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා දැනටමත් කටයුතු සිදුකරමින් පවතී. | අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | 2018 වර්ෂයට අදාලව යල හා මහ කන්න වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා රු.2,200,000,000 ක ප්‍රතිපාදන මහ භාණ්ඩාගාරයෙන් අනුමත වී තිබුණද සමාලෝචිත වර්ෂය තුළ ඉන් ලැබී තිබුනේ රු.437,980,000 ක් පමණි. මෙම සම්පූර්ණ මුදලම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණු අතර ඉතිරි මුදල වන රු.1,762,120,000 ලැබිය යුතු ලෙස ශේෂ පත්‍රයේ පෙන්වා තිබුණි. මෙම මුදල විගණිත දිනය දක්වාම ආයතනය වෙත ලැබී නොතිබුණු | 2018 වර්ෂයට අදාල රාජ්‍ය අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමේදී අනිවාර්යය වගා රක්ෂණය සඳහා වාර මුදල් ලෙස රු: මිලියන 2,200 ක් වෙන් කරන ලද අතර, එම වාර මුදලින් මණ්ඩලය වෙත නොලැබුණු වාරික මුදල වූ රු:1,762,120,000/- වාර මුදල් ඉල්ලා මහා භාණ්ඩාගාරයට ඉල්ලීම් ලිපි යවා ඇති අතර, එම මුදල් ලබාගැනීමට අවශ්‍ය දැනුවත් කිරීම් මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇත. මහා භාණ්ඩාගාරය විසින් ඉදිරියේදී එම මුදල් ලබාදීමට කටයුතු කරන බව වාචිකව දන්වා ඇත. | 2019 ජූනි 06 දින රු.මි.1,762 ට ප්‍රතිපාදන මහ භාන්ඩාගාරයෙන් අනුමත වී තිබුනද 2019 ජූලි 15 දිනට මින් රු.මි. 500 ක් පමණක් ලැබී ඇති බැවින් ඉතිරි මුදල්ද ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

අතර භාන්ඩාගාරයෙන් ලබාදෙන බවට තහවුරු ලිපියක්ද ලබාදී නොතිබුණි. මෙම ලැබිය යුතු මුදල ගිණුම් ලද කිරීම නිසා වර්ෂය තුළ ලාභය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 1860 කින් පමණ වැඩි වී තිබුණි.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,540,444 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු තුළ 2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා ගෙවිය යුතු විගණන ගාස්තු මෙතෙක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | විගණන ගාස්තු ක්‍රමිකව ගෙවීමට කටයුතු කරනු ලැබේ. 2016 වර්ෂයට අදාල විගණන ගාස්තුව අනෙක් වර්ෂවලට සාපේක්ෂව තුන් ගුණයකින් පමණ වැඩිකර ඇති බැවින් එම විගණන ගාස්තුවට එකඟවිය නොහැකිබව හා එම ගාස්තුව අඩුකර දෙන මෙන් 2018.10.04 වෙනි දින ලිපියක් යවා ඇති අතර මේ දක්වා එයට පිලිතුරු ලැබී නොමැත. | විගණන ගාස්තු ක්‍රමිකව ගෙවීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2015 මැයි 25 දිනැති අංක 1/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2 ඡේදය | නිල වාහන හිමිකම් හා ප්‍රවාහන දීමනාව හිමිකම් නොමැති, අංශ ප්‍රධානියෙකු වෙනුවෙන් මසකට රු.8,000ක් ද විධායක නිලධාරියෙකු වෙනුවෙන් රු.4,000 ක් ද බැගින් සමාලෝචිත වර්ෂ සහ ඉකුත් වර්ෂ 03 තුළ රු.3,083,490 ක මුදලක් ගෙවා තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED1/2015 දරණ චක්‍රලේඛයට අනුව ප්‍රවාහන පහසුකම් හිමි නිළධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට මණ්ඩලය සතුව භාවිතයේ පවතින වාහන ප්‍රමාණවත් නොවන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව මෙම දීමනාව ලබාදී ඇත. | චක්‍රලේඛයට අනුගතව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 978,995,887 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 49,930,208 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.929,065,679 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට 2018 වර්ෂයට අදාලව යල හා මහ කන්න වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලයට ලැබියයුතු වාරික මුදල වූ රු:1,762,120,000 ක ප්‍රමාණය ආදායමක් ලෙස ගිණුම් ගත කිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 අප්‍රේල් 01 සිට 2019 මාර්තු 31 දක්වා අනිවාර්ය බෝග වර්ග 6 වෙනුවෙන් නොමිලේ රක්ෂණය සඳහා උපරිම රක්ෂණ වගකීම් වටිනාකම රු.5,000,000,000 ක් පමණ විය හැකි රක්ෂණ වගකීමට ප්‍රතිරක්ෂණ වටිනාකම රු.3,500,000,000 ක් වුවත් මහ බැංකු වාර්තාව නිවැරදිව යොදා නොගැනීම නිසා රක්ෂණ වගකීම් වටිනාකම රු.7,500,000,000 ක් ලෙස තීරණය කර රු.5,315,000,000 ක ප්‍රතිරක්ෂණ වගකීමට ආයතනය එළඹීම හේතුවෙන් රු.1,815,000,000 ක් වැඩියෙන් තක්සේරු කර තිබුණි. | ස්වාභාවික විපත් සඳහා අක්කරයකට ගෙවූ වන්දි මුදල රු. 10,000/- සිට රු. 40,000/- දක්වා වැඩිකල අතර, ඊට සමගාමීව රක්ෂණ වගකීමද වැඩිවී ඇත.මෙම ප්‍රතිරක්ෂණ ක්‍රියාවලියේදී අනිවාර්යය වගා රක්ෂණයට අයත් වන භෝග වගාවන්හි (වී, බඩඉරිඟු සෝයා ලොකු ළූණු අර්තාපල්) 2018 වර්ෂය තුළ දළ වගා වපසරිය අක්කර 2,751,244 ක් ලෙස සලකා මහ බැංකු වාර්තා අනුව අපේක්ෂිත වගා හානි වපසරිය වගාව මෙන් 15% ක් එනම් අක්කර 412,686 ක් රජයේ වගකීම තීරණය කර ඇත. මෙම අක්කර ප්‍රමාණය සඳහා මුළු වගකීම රු.මිලියන 82,537 ක් සේ සලකා ඇත.<br>මෙම වගා වපසරියෙන් 15% ක් හානි වෙතැයි අපේක්ෂා කර ඇති අතර, සියළු හානි සාමාන්‍යයෙන් වගාවේ දෙවන අවස්ථාවේ සිදුවිය හැකිය යන පදනමින් මුළු රක්ෂණ වගකීම රු: මිලියන 7,500 ක් සේ සලකා ඇත. මෙය මහ බැංකු වාර්තාවට අනුව රු: මිලියන 15,000/- කි. (82537x 15% = 12380 x 60%)<br>මුළු වගකීම රු. මිලියන 82,537<br>විය හැකි හානි ප්‍රමාණය 15%ක්<br>රු. මිලියන=12,380 | මහ බැංකු වාර්තාවේ සඳහන් අක්කර ගණන පරිදි වගකීම තක්සේරු කල යුතුය. |

| | | |
|---|---|---|
| | හානි අවස්ථාව උපකල්පන මත දෙවන අවස්ථාව 60%<br>අපේක්ෂිත වගකීම රු: මිලියන 7,500 (12,380x60%)<br><br>මේ අනුව, රක්ෂණ වගකීම අධි තක්සේරුවීමක් සිදුවී නොමැත. | |
| (ආ) ඉහත සඳහන් ප්‍රතිරක්ෂණයට අදාළ ගිවිසුම අනුව රු.2,185,000,000 ක් දක්වා වන්දි වටිනාකම මණ්ඩලය විසින් දැරීමටද රු.1,500,000,000 ක වන්දි මුදල් ජාතික රක්ෂණ භාර අරමුදලින් දැරීමෙන් පසු ප්‍රතිරක්ෂණයට යාමට හිමිකම පවතී. ප්‍රතිරක්ෂණ වාරික වටිනාකම වූ රු.675,760,000 ක් මණ්ඩලය විසින් ගෙවීම මත රු.4,360,760,000 ක් දේශීයව වන්දි වෙනුවෙන් දරනු ලබයි. 2019 අප්‍රේල් 30 වනවිට 2018 යල හා 2018/19 මහ කන්න වෙනුවෙන් ගෙවන ලද මුලු වන්දි වටිනාකම රු. 412,617,374 ක් වීමෙන් විදේශීය ප්‍රතිරක්ෂණ වාරික ලෙස ගෙවූ රු.473,032,000 ක මුදල නිෂ්කාර්ය වියදමක් ලෙස පත් වී තිබුණි. | පැවති දේශගුණික තත්ත්වය තුල දැඩි අවධානමක් හටගෙන තිබුණු බැවින් හා මෙම තත්වයෙහි පෙර පැවති කන්න හා සසඳන විට දැඩි අවධානමක් ඇති බැවින් ප්‍රතිරක්ෂණය ලබාගෙන ඇත. මෙම ප්‍රතිරක්ෂණය සඳහා පදනම් වුයේ රක්ෂණ ක්‍රියාපටිපාටියට අනුව පුරෝකථනය කරන ලද වගකීමකි. එසේ බලාපොරොත්තු වූ පරිදි හානියක් සිදු වුයේ නම් ප්‍රතිරක්ෂණයෙන් හානි පූරණය කිරීමට හැකිවනු ඇත. මෙම ප්‍රතිරක්ෂණය ලබා ගැනීමේදී කැබිනට් මණ්ඩලය අනුමත ටෙන්ඩර් මණ්ඩලයක් මඟින් හා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් තාක්ෂණික කමිටුවක් මඟින් මෙය සිදු කිරීමට කටයුතු කර ඇති අතර රක්ෂණ ක්‍රමවේදය තුළ කටයුතු කර ඇති නිසා මෙම වාරික මුදල නිෂ්කාර්යය වියදමක් ලෙස හඳුනා ගත නොහැක. | අතීත හානි දත්තද මහ බැංකු වාර්තා මත පදනම් වූ දත්ත හා 2018 යල හා 2018/2019 වන්දි ගෙවීම්ද සලකා බැලූවිට විදේශීය ප්‍රතිරක්ෂණයට ගෙවූ මුදල නිෂ්කාර්ය බැවින් දේශීය ප්‍රතිරක්ෂණයට යා යුතුය. |
| (ඇ) 2018 ජනවාරි 03 සිට 2018 මාර්තු 16 දක්වා මණ්ඩලය වෙත වාර්තාගත වූ ගොවි ඇමතුම් 16,466ක් වාර්තා ගත කිරීමට මණ්ඩලයේ නිලධාරින් 43 කගේ නිත්‍ය රාජකාරි වලින් බැහැරව රාජකාරි පැය 15,587 ක් මිඩංගු කර ලබාගත් ගොවීන්ගේ නම වගා හානි කාලය, අක්කර ප්‍රමාණය, ප්‍රදේශය සහ හැඳුනුම්පත් අංකය ලේඛනයක සටහන් කර තිබුණ ද එම දත්ත වන්දි ගණනයේදී ගොවි අයදුම්පත් සමඟ සැසඳීමක් කර නොගැනිමෙන් ඒ සඳහා ගතකල කාලය නිෂ්කාර්ය වී තිබුණි. | මෙම දත්ත සමග සසඳා ගොවීන් වෙත හානි අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු ආරම්භ කලද විශාල වශයෙන් හානි වාර්තාවීමත් සමග ප්‍රායෝගිකව එම කාර්යය සිදුකිරීමට නොහැකිවීම මත එය ක්‍රියාත්මක නොකල අතර, හානි දැනුම් දීම් විස්තර වන්දි ගෙවීම සඳහා යොදාගන්නා ලදී. | ලබාගත් තොරතුරු පදනම් කරගෙන ගෙවීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2016 /2017 මහ කෙතට අරුණ වන්දි ලෙස ගොවීන් 8,185 කට ගෙවූ රු.70,800,200 ක මුදලක් ගිණුම් අංක, ගොවියාගේ නම හා හැඳුනුම්පත් අංකය නොගැලපීම හේතුවෙන් බැංකු මඟින් ප්‍රතික්ෂේප වී තිබූ අතර එම මුදල් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගොවීන් හඳුනාගෙන ඔවුන්ට දන්වා තොරතුරු සොයා ගෙවීමට ආයතනය විසින් කටයුතු නොකර එම මුදල් රඳවාගෙන තිබුණි. | ගෙවීම් ප්‍රතික්ෂේපිත වූ ගොවීන් සඳහා සංශෝධිත ලේඛණ සකස් කර එවන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති අතර, එසේ ලැබෙන නිවැරදි ලේඛණ ලද වහාම ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. | නිවැරදි තොරතුරු බැංකුවට ලබා දීමට කටයුතු කල යුතුය. |
| (ඉ) දර්ශක මත පදනම්වූ රක්ෂණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට ගොවීන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිහිටුවීම අත්‍යාවශය වුව ද එය මෙතෙක් පිහිටුවා නොතිබුණු අතර 2017 වර්ෂයේදි රු.64,400 ක් වැය කර දෘඩාංග හා මෘදුකාංග මිලදී ගැනීමට පුවත්පත් දැන්වීම් පලකර තිබුණද අවශ්‍ය උපකරණ මිලදි නොගැනීමෙන් දරන ලද වියදම නිශ්කාර්ය වී තිබුණි. | ගොවීන්ගේ තොරතුරු ඇතුලත් කිරීමට හා ඉඩම් හා යායවල් සිතියම් ගත කිරීමට අවශ්‍ය දත්ත පද්ධතියක් නිර්මාණය කොට අවසන් කර ඇති අතර, ජංගම දුරකථන යොදා ගෙන ඉහත සඳහන් කාර්යයන් සිදු කිරීමට මොඩියුලයක් ද නිර්මාණය කොට අවසන් කර ඇත. | ගොවීන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතිය පිහිටුවීමට කටයුතු කල යුතුය. |
| (ඊ) දිවයින පුරා පොහොර ලබාගන්නා ගොවීන්ගේ අයදුම්පත් ස්කෑන් කර පරිගණක ගත කිරීමට විධිමත් සැලසුම් කිරීමක් සිදු නොකර දිස්ත්‍රික්ක 5 ක පමණක් ගොවි අයදුම්පත් 281,250 ක් පමණක් ස්කෑන් කර පරිගණක ගතකර තිබුණි. මේ සඳහා 2017 අගෝස්තු සිට 2018 ජූලි දක්වා රු.2,757,809ක වියදමක් දරා තිබුණ ද එම දත්ත වන්දි ගෙවීමේ ක්‍රියාවලියට උපයෝගි කර නොගෙන වන්දි ගණනය කිරීමට අදාළ දිස්ත්‍රික් කාර්යාල වෙත මණ්ඩලයේ නිලධාරීන් යොමු කිරීම නිසා එම වියදම නිශ්කාර්ය වියදමක් ලෙස හඳුනාගත හැක. | මෙම දත්තයන් හා පොහොර සහනාධාරය ලබා දුන් ගොවීන්ගේ ලේඛණය පදනම් කරගෙන ගොවීන්ගේ තොරතුරු වන්දි ගණනය කිරීමට අදාල දත්ත පද්ධතිය සකස් කිරීමට අදාල කරගෙන ඇත. | රක්ෂණ අංශය සමග සාකච්ඡාවේදි එම තොරතුරු යොදා නොගත් බව ප්‍රකාශ කිරීම නිසා ඉදිරියේදී වන්දි ගණනය සඳහා යොදා ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 / 2017 මහ කෙතට අරුණ අතුරු බෝග වගාකර හානි වූ කුරුණෑගල ගොවීන් 32 කට හිමි රු.276,800 ක මුදලක් වැරදීමකින් එක් ගොවියෙකුගේ ගිණුමකට බැරවී තිබීම නිසා ඉතිරි ගොවීන් 31 දෙනාට ගෙවීම් අවස්ථා මගහැරී තිබුණි. | මෙම ගොවීන් 32 කට අදාල එකම ගිණුම් අංකයට බැර කරන ලද මුදල් බැංකුව විසින් රඳවාගෙන ඇති අතර, මෙම ගෙවීම් පිළිබඳව අමාත්‍යාංශය මගින් විමර්ශනයක් සිදුකර එම මුදල අයකර ගෙන ඇත. ගෙවීම් ප්‍රතික්ෂේපිත ගොවීන් සඳහා නැවත ගිණුම් අංක නිවැරදි කර එවන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත. එම තොරතුරු ලද විගස ගෙවීම් සිදුකරනු ලැබේ | අදාල පාර්ශවයන්ගේ නිවැරදි තොරතුරු ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) 2016 / 2017 මහ කන්නයේදී එක් ගොවි මහතෙකුට රු.10,000 බැගින් පමණක් වන්දි ගෙවිය යුතු වුවත් දිස්ත්‍රික්ක 07 ක එකම හැඳුනුම්පත් අංකය හා එකම නම සඳහන් ගොවීන් 364 කට රු.3,148,600 ක් හා දිස්ත්‍රික්ක 5 ක හැඳුනුම්පත් අංකයෙහි වෙනස්කම් සහිත එකම නම සඳහන් ගොවීන් 50 ක් වෙත රු.432,500 ක මුදලක් චක්‍රලේඛ නියමයන්ට පටහැනිව දෙවරක් ගෙවා තිබූ අතර එම වැඩිපුර ගෙවූ මුදල් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වන්දි ලේඛණයට අදාලව ගොවි බිම, ගොවියා, ඉඩමේ අයිතිය හා බැංකුව හඳුනා ගැනීම සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් භාවිතා කරන ලද මූලික ලේඛණය වන ඉල්ලුම් පත්‍ර අංකය (DO Serial No) පරීක්ෂා කිරීමේදී වෙනම මූලික ලේඛණ ඇති බව තහවුරු විය. මෙම ගොවීන් සඳහා ගෙවීම් කිරීමේදී ජාතික හැඳුනුම්පත් අංකයෙහි සුළු සුළු වෙනස්වීම් පැවතීම නිසා ඉහත තත්වය පැන නැඟී ඇති අතර, චක්‍රලේඛණ වල සඳහන් පරිදි පොහොර සහනාධාර ගෙවීම සඳහා යොදා ගන්නා ක්‍රමවේදයම හා එම දත්ත පද්ධතිය මගින් ගෙවීම් කිරීම සිදුකර ඇත. | අදාල පාර්ශවයන්ගේ නිවැරදි තොරතුරු ලබාගැනීමට කටයුතු කල යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මහියංගනය හා ඇඹිලිපිටියේ පිහිටි නිල නිවාස අවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කිරීමකින් තොරව වර්ෂ 10- 20 කට අධික කාලයක සිට නිශ්ක්‍රීයව පවතී. | අදාල වත්කම් ප්‍රතිසංස්කරණය කර භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රතිසංස්කරණය කර භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගතයුතුය. |

| | | |
|---|---|---|
| (ආ) මහනුවර, අම්පාර, මනම්පිටිය හා මහව යන දිස්ත්‍රික්කයන්හි කෘෂි රක්ෂණ මණ්ඩලයට අයත් දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉඩම් පවරාගෙන තිබුණද, එම ඉඩම්වල ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු නොකර එදින සිට වසර 1-11 දක්වා කාලයක් කුලියට ගත් ගොඩනැගිලිවල කාර්යාල පවත්වාගෙන යමින් තිබුණි. | මෙම ඉඩම් වල අයිතිය නියමාකාරයෙන් පවරාගෙන දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම සඳහා අරමුදල් සපයාගෙන ඉදිකිරීමට කටයුතු කරනු ලැබේ | දිස්ත්‍රික් කාර්යාල කඩිනමින් ඉදිකර කුළී ගොඩනැගිලි වලින් ඉවත්වීමට කටයුතු කලයුතුය. |
| (ඇ) අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව මිලට ගත් රු.1,790,956 ක් වටිනා ආකෘතිපත්‍ර හා වන්දි අයඳුම්පත්‍ර භාවිතා කිරීමකින් තොරව ගබඩාවේ නිශ්ක්‍රියව පැවතුණි. | රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස්වීමත් සමග සමහර ලේඛණ වෙනස් කිරීමට සිදුවන අතර, භාවිතා කල හැකි සියළු ලේඛණ භාවිතා කරනු ලැබේ. | අනවශ්‍ය ආකෘතිපත්‍ර ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වසර කිහිපයක සිට අනුමත කාර්යමණ්ඩලය තුල පවතින පුරප්පාඩු සඳහා සමාලෝචිත වර්ෂයේදී බඳවා ගැනීමට කටයුතු නොකිරීම මත අධ්‍යක්ෂ තනතුරු 5 ක් නියෝජ්‍ය සහකාර අධ්‍යක්ෂ තනතුරු 7 ක් පරිපාලන නිලධාරී තනතුරු 2 ක් සංවර්ධන නිලධාරී තනතුරු 16 ක් කළමනාකරණ සහකාර තනතුරු 65 ක් හා රියදුරු 12 ක පුරප්පාඩු පැවතීම ආයතනයේ කටයුතු වලට බාධාවක්ව තිබියදී එම පුරප්පාඩු පිරවීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය සේවක සංඛ්‍යාව බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා යවා ඇති අතර අනුමැතිය ලද වහාම නිසි ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් බඳවා ගැනීම් සිදුකරනු ලැබේ | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව පුරප්පාඩු පිරවීමට කටයුතු කලයුතුය. |
| (ආ)වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි 2018 වර්ෂයේ බඳවා ගැනීම පටිපාටිය සංශෝධනය කිරීමට හා එම පටිපාටියේ සුදුසුකම්වලට අනුකූලවන ආකාරයට මණ්ඩලයට ආවේනික වැටුප් ව්‍යුහයක් සකස් කිරීමට සැලසුම් කර තිබුනද එය සිදුකර නොතිබුණි. | බඳවා ගැනීම පටිපාටිය සංශෝධනය කිරීමට අදාලව ලැබී ඇති යෝජනා පිළිබඳව කමිටුවක් පත්කර සාකච්චා කිරීමෙන් අනතුරුව සංශෝධනය කටයුතු නිම කර ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. | වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි බඳවා ගැනීම පටිපාටිය සංශෝධනය කිරීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 ක්‍රියාකාරී සැලැස්ම අනුව අනෙකුත් වගා රක්ෂණයන් යටතේ උඳු, කවුපි හා මුංඇට ආදී වගා අක්කර 13,154 කින් රු.12,109,000 ක රක්ෂණ ආදායමක් ඉපයීමට අදහස් කර තිබුණද සත්‍ය වශයෙන් උපයා තිබුණේ රු.2,223,095 කි.එය අපේක්ෂිත අගයෙන් සියයට 18 ක ප්‍රමාණයකි. | රාජ්‍ය බැංකු හරහා වගා ණය ලබා ගැනීමට ඉල්ලුම් කරන ගොවීන්ට රක්ෂණ ආවරණ ලබාදීම මඟින් ඉහල වාරික ආදායමක් ලබා ගැනීමට ඉලක්ක කලද ගොවි ජනතාවගේ ඉල්ලුම හා වගා ණය ලබා දීමේ සීමාවන් මත අපේක්ෂිත ප්‍රගතිය ලගා කරගත නොහැකි විය. | ලභාකරගත හැකි ඉලක්ක ලබාදීමට කටයුතු කල යුතුය. |
| (ආ) කාලගුණික දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමයේ නියමු ව්‍යාපෘතියේ දෙවන අදියර පොළොන්නරුව, අම්පාර හා කුරුණෑගල දිස්ත්‍රික්ක මූලික කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට අදහස් කළද ඒ අනුව ක්‍රියාත්මක වී නොතිබුණි. | නියමු ව්‍යාපෘතියේ දෙවන අදියරේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන පොළොන්නරුව , අම්පාර, කුරුණෑගල දිස්ත්‍රික්කයන් හි අවශ්‍ය මූලික දත්ත තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරේ. | නියමු ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා අවශ්‍ය දත්ත, තොරතුරු කඩිනමින් ලබාගැනීමට කටයුතු කලයුතුය. |
| (ඇ) දර්ශක මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම යටතේ තාක්ෂණික මෙවලම් මිලදී ගැනීමටද එයට අවශ්‍ය පරිගණක මෘදුකාංග මිලදී ගැනීමට මණ්ඩලය අපේක්ෂා කළද එම කාර්යයද අතර මග ඇණහිට තිබිණි. | අවශ්‍ය දෘඩාංග හි මෘදුකාංග මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවක් පත්කරන ලෙස තාක්ෂණ ඇගයීම් කමිටුව උපදෙස් ලබා දී ඇත. | රක්ෂණ ක්‍රමවේදය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය උපාංග මිලදී ගැනීමට කටයුතු කල යුතුය. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත් රක්ෂණය වූ ගොවීන් පිළිබඳව හා වගා බිම් පිළිබඳව නිවැරදි දත්ත පද්ධතියක් බිහි කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මේ වන විට ගොවීන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතිය සකස් කිරීම ආරම්භ කර ඇති අතර, ගොවීන්ගේ තොරතුරු ඇතුලත් කිරීමට හා ඉඩම් හා යායවල් සිතියම් ගත කිරීමට අවශ්‍ය දත්ත පද්ධතියක් නිර්මාණය කොට අවසන් කර ඇති අතර, ජංගම දුරකථන යොදා ගෙන ඉහත සඳහන් කාර්යන් සිදු කිරීමට මොඩියුලයක් ද නිර්මාණය කොට අවසන් කර ඇත. | මොඩියුලයට අවශ්‍ය දත්ත ඇතුලත් කර කර නොමැති බැවින් කඩිනමින් එය සිදුකල යුතුය. |